දිනමිණ සිළුමිණ The Dinamina The Silumina epaper

# ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

# වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය (NEVIDA)

## පුරප්පාඩු

ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය අනුබද්ධ අධිකාරියක් වශයෙන් ක්‍රියාත්මක වන 2018 අංක 32 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද, වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ **ප්‍රාදේශීය අධ්‍යක්ෂ** (පුරප්පාඩු-01) හා **ගණකාධිකාරී** (පුරප්පාඩු-01) තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ප්‍රාදේශීය අධ්‍යක්ෂ
**තනතුරු 01**

**01. වැටුප් පරිමාණය:** MM 1-3-2016 Rs. [55,925-10 x 1,375-15 x 1,910 -98,325/-] (මාසික)

**02. වයස:**
අයදුම්කරුගේ වයස 2024.03.11 වන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**03. සුදුසුකම්:**

**බාහිර අපේක්ෂකයින්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යාව/ විද්‍යාව/ ව්‍යාපාර/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍ය/, කළමනාකරණය හෝ ඉංජිනේරු යන විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රථම උපාධිය.
   සහ
   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ මධ්‍ය කළමනාකරු (MM 1-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවයක් සම්පූර්ණ කිරීම.

### ගණකාධිකාරී
**තනතුරු 01**

**01. වැටුප් පරිමාණය:** MM 1-1-2016 Rs. [53,175-10 x 1,375-15 x 1910 -95,575/-] (මාසික)

**02. වයස:**
අයදුම්කරුගේ වයස 2024.03.11 වන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**03. සුදුසුකම්:**

**බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ/ වාණිජ්‍ය/ මූල්‍ය/ ව්‍යාපාර පරිපාලනය (විශේෂ), ගිණුම්කරණය හෝ මුදල්/ ව්‍යාපාර කළමනාකරණය (ගිණුම්කරණය/මුදල්) යන විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය
   සහ
   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සේවා පළපුරුද්ද
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අතරමැදි විභාගය සමත්වීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**
ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

**04. වෙනත් සුදුසුකම්:**
සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**05. බඳවා ගැනීමේ ක්‍රමවේදය:**
අයදුම්පත් කැඳවීමෙන් පසුව අධිකාරිය විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙලට පත්වීම් සිදු කරනු ලැබේ. (සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අදාළ වේ.)

**06. තනතුරේ ස්වභාවය:**
මෙම තනතුර ස්ථිර වන අතර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**07. අයදුම්පත ඉදිරිපත් කළ යුතු ක්‍රමවේදය:**
ඉහත තනතුර සඳහා සෑම අතින්ම සුදුසුකම් ලත් අයදුම්කරුවන් **www.smehci.gov.lk** දරණ වෙබ් අඩවියෙහි සඳහන්ව ඇති ආකෘතිය පරිදි තමා විසින් සකස් කරන ලද අයදුම්පතක් සමග ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, සේවා පළපුරුද්ද දැක්වෙන සහතික හා වෙනත් කුසලතා හා කාර්ය සාධනයන්හි සහතිකවල පිටපත් සහිතව **සභාපති, වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ-03 ලිපිනයට 2024.03.11 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.)**

රාජ්‍ය /රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් 2024.03.11 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

ප්‍රමාද වූ අයදුම්පත්/ අසම්පූර්ණ අයදුම්පත්/ නියමිත ආකෘතියෙන් තොරව ඉදිරිපත් කළ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08. වෙනත් විස්තර:**
වැඩිදුර තොරතුරු සඳහා **www.smehci.gov.lk** වෙබ් අඩවියේ **පුරප්පාඩු තීරයට පිවිසිය හැක..**

**සභාපති,**
**වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය,**
**අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ-03.**